මගේ අංකය :-

මහ නගර සභාව/ප්‍රදේශීය සභාව

..............................

.............................

2021.03.

ගෞරවනීය ස්වාමීන් වහන්ස/විදුහල්පති/ප්‍රධානාචාර්ය/කලායතනාධිපති/

මහත්මයාණෙනි/මහත්මියනි,

## සරසවි සංහිඳ ප්‍රාදේශීය කලා උළෙල - 2021

උතුරු මැද පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන උතුරු මැද කලා උළෙල ට සමගාමීව පවත්වනු ලබන සරසවි සංහිඳ ප්‍රාදේශීය කලා උළෙල මෙවර පැවැත්වමට කටයුතු සූදානම් කර ඇත. උතුරු මැද පළාත තුළ සිටින විවිධ කලා කරුවන්ගේ දක්ෂතා අගය කිරීම හා ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ සිටින ජනතාවගේ කලා රසඥතාවය වර්ධනය කිරීම හා ඒ ඔස්සේ අපගේ දේශීය සංස්කෘතික උරුමයන් මතු පරපුරට දායාද කිරීම මෙහි මූලික අරමුණ වේ.පළාත තුළ සිටින විවිධ කලාකරුවන් ගේ පහසුව සඳහා ප්‍රාදේශීය සරසවි සංහිඳ කලා මංගල්‍යා පැවැත්වීමට තීරණය කර ඇත.

02. මෙමගින් දුෂ්කර ප්‍රදේශ වල සිටන විවිධ දක්ෂතාවයන්ගෙන් හෙබි කලාකරුවන් හඳුනා ගැනීමත් ඔවුන්ගේ හැකියාවන් අගය කිරීමත් කලා කටයුතු සඳහා දිරිගැන්වීමත් අපේක්ෂා කෙරේ.මෙයින් ජයග්‍රහණය කරන තරගකරුවන් උතුරු මැද කලා උළෙලට සහභාගි කරවන අතර කලාකරුවන් ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා රැගෙන යාමත් සිදුවේ.මෙහිදි චිත්‍ර,මූර්ති කැටයම් ගොක්කලා නර්තන,සංගීත සාහිත්‍ය හා නිවේදන තරග පැවැත්වීට අපේක්ෂා කෙරේ.එමෙන්ම ජයග්‍රාහකයින් සඳහා වටිනා සහතිකපත් හා ත්‍යාග පිරිනැමීමට කටයුතු කරන අතර අදාළ චක්‍රලේඛය මේ සමග ඉදිරිපත් කරමි.

03.දැනට රටේ පවතින කොවිඩ් 19 තත්ත්වය යටතේ පූර්ණ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් තරග සහ උත්සව කටයුතු සංවිධානය කළ යුතු වේ.

**<u>සරසවි සංහිඳ තරග සඳහා ඉදිරිපත් වන තරගකරුවන්ට බල පැවැත්වෙන පොදු කොන්දේසි</u>**

01. තරග සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන් හා සෑම ශිල්පියෙකුම උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. තරග සඳහා ඉදිරිපත් වන පාසල් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ පිහිටා තිබිය යුතුය.

02. කලායතන තරග සඳහා ඉදිරිපත් වන සියළුම ශිල්පීන් තම කලායතනයේ පුහුණුව ලබන අය විය යුතුය. එක් ශිල්පියෙකුට කලායතන දෙකක් නියෝජනය කරමින් තරග සඳහා ඉදිරිපත් විය නොහැක. ඒ බවට පැමිණිල්ලක් ලැබුණහොත් අදාල කලායතනයේ ප්‍රතිඵල අවලංගු කරනු ලැබේ.

03. පාසල් තරගකරුවන් සඳහා ශිෂ්‍යභාවය පිළිබඳව විදුහල්පතිගේ සහතිකය ඉදිරිපත් කළ යුතු අතර අදාළ ත්‍යාග මුදල අදාළ පාසලට පිරිනමනු ලැබේ.

04. මෙම සරසවි සංහිඳ ප්‍රාදේශීය කලා උළෙල තරග සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්මාණ මීට පෙර පවත්වනු ලැබූ පළාත් මට්ටමේ හෝ ජාතික මට්ටමේ තරග සඳහා ඉදිරිපත් කර **<u>ජයග්‍රහණය ලැබූ නිර්මාණ නොවිය යුතුය.</u>**

05. හොඳම නර්තන කලායතනය තේරීමේ තරග ඉසව්ව සඳහා එක් කලායතනයකට ඉදිරිපත් විය හැක්කේ තෝරා ගත් තරග ඉසව් 05 කට පමණි. සෑම තරගයක් සඳහාම තම කලායතනයේ ශිල්පීන් පමණක් සහභාගි විය යුතුය. යම් හෙයකින් ඔබ කණ්ඩායමකට ඉදිරිපත් වන ශිල්පීන් එම කලායතනයේම නොවන බව සනාථ වුවහොත් ජයග්‍රහණය ලබා තිබුණ ද තරගයෙන් ඉවත් කිරීමට සිදුවන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

06. ගුරු තරග සඳහා ඉදිරිපත් වන තරගකරුවන්ට පළාතේ පදිංචි ඕනෑම බෙර වාදන ශිල්පියෙක් යොදා ගැනීමේ අවකාශය ඇත.

07. ප්‍රායෝගික තරග සඳහා ඉදිරිපත් වන තරග කරුවන් පුහුණු ඇඳුමින් තරග කළ හැක .එහෙත් ජයග්‍රහණය ලබන තරගකරුවන් උතුරු මැද කලා උළෙලේ තරග සඳහා ඉදිරිපත් වීමේදි රංග වස්ත්‍රාභරණ භාවිතා කළ යුතු වේ.

08. වෙනත් අයෙකුගේ නිර්මාණයක් ඕනෑම තරග ඉසව්වක් සඳහා ඉදිරිපත් කර ඇති විටෙක ඒ බව සනාථ කෙරෙන ඕනෑම අවස්ථාවක එය අවලංගු කරනු ලැබේ. යම් හෙයකින් එවැනි නිර්මාණයක් යම් ජයග්‍රහණයක් ලබා තිබුණද අදාල ත්‍යාග සහ සහතික /සම්මාන යනාදී සියල්ලම අවලංගු කිරීමට කටයුතු කෙරේ. එවැනි අවස්ථාවක අදාළ සහතික, ත්‍යාග මුදල්, සම්මාන අවලංගු කර දින 14 ක් ඇතුළත පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව වෙත භාරදිම තරගයන් සඳහා ඉදිරිපත්වූ අයගේ පූර්ණ වගකීම වේ.

09. සෑම තරගයකම ජයග්‍රාහක/ජයග්‍රාහිකාවන් සඳහා සහතික පත් සහ ත්‍යාග මුදල් පිරිනමනු ලැබේ.

10. සරසවි සංහිද ප්‍රාදේශීය කලා උළෙල සියලුම තරග ඉසව් විනිශ්චය සඳහා සුදුසුකම් ලත් විනිශ්චය මණ්ඩල පත් කරනු ලබන අතර විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන සියලුම තීරණ සඳහා තරගකරුවන් එකඟ විය යුතු අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

11. කිසියම් තරග ඉසව්වක් සඳහා ගුණාත්මක වශයෙන් ප්‍රමාණවත් නිර්මාණ ඉදිරිපත්ව නොමැති නම් එම ඉසව්ව සඳහා ජයග්‍රහණය ලබා නොදීමට විනිශ්චය මණ්ඩලයට බලය ඇත.

12. සෑම තරගකරුවෙක්ම ඉදිරිපත් කරන සෑම තරගයක් සඳහාම වෙන වෙනම අයදුම්පත් මෙම චක්‍රලේඛයේ අවසානයේ අමුණා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර එවිය යුතුය. සමූහ තරග අංශයන් සඳහා අදාළ ආයතනය විසින් එක් අයදුම්පතක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වන අතර, අදාල තරග ඉසව්වට සහභාගිවන ශිල්පී/ශිල්පිනීන්ගේ නාම ලේඛණය අයදුම්පතට අමුණා එවිය යුතුය.

13. අසම්පූර්ණව ඉදිරිපත් කරන ලද අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**සරසවි සංහිද ප්‍රාදේශීය කලා උළෙල-2021**" සහ අදාළ තරග ඉසව්ව හෝ අංශයේ නම සඳහන් කළ යුතුය.

15.උතුරු මැද පළාත තුළ අවුරුදු 03කට වැඩි කාලයක් සේවය කරන රාජ්‍ය නිලධාරීන්ට කලා උළෙල තරග සඳහා ඉදිරිපත් විය හැකිය. ඒ බව තම ආයතන ප්‍රධානියා විසින් සනාථ කළ යුතුය.

16. අදාළ තරඟ ශීර්ෂයන්හී වයස් සීමාව ලෙස **2021 අගෝස්තු මස 15** දිනය සලකා බලනු ලැබේ.

18. සෑම තරගයක් සඳහා ම අයදුම්පත් හා නිර්මාණ ඉදිරිපත් කළ යුතු අවසාන දිනය ............ වේ. විශේෂයෙන් සඳහන් කර නොමැති තරග ඉසව් සඳහා අයදුම්පත් හා නිර්මාණ තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. එම දිනට පසුව ඉදිරිපත් කරන පිටපත් හා නිර්මාණ පසුව භාරගනු නොලැබේ.

## 01. <u>චිත්‍ර, මූර්ති, කැටයම් හා ගොක් කලාව තරගය</u>

- ❖ පාසල්/ දහම් පාසල් හා උසස් අධ්‍යාපන ආයතන වල ඉගෙනුම ලබන දරු දැරියන් හෝ උතුරු මැද පළාතේ චිත්‍ර, මූර්ති, කැටයම් හා ගොක් කලාව පිළිබඳ විශේෂ දක්ෂතාවයක් ඇති අය විය යුතුය.
- ❖ මේ සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නිර්මාණ තරඟ අවස්ථාවේදීම නියමිත කාල සීමාව තුළ නිමවිය යුතුය.
- ❖ සියළුම අයදුම්කරුවන් පහත සඳහන් කොන්දේසි වලට යටත් වන අතර, විභාග ප්‍රවේශ පත්‍රය සමග ලැබෙන උපදෙස් අනුව තරගයට ඉදිරිපත් විය යුතුය.

## 1.1 <u>චිත්‍ර තරගය</u>

මේ සඳහා කැමති සායම් වර්ගයක් භාවිතා කළ හැකි අතර, අයදුම්කරුවන්ට දෙනු ලබන මාතෘකා අතුරින් එකක් යටතේ නිර්මාණයක් ඉදිරිපත් කිරීමට අවසර ඇත.

ත්‍යාග.

### 1.1.1 <u>ප්‍රාථමික අංශය (1-2 ශ්‍රේණි සඳහා)</u>

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ කුසලතා සහතික- 10

### 1.1.2 <u>පශ්චාත් ප්‍රාථමික අංශය (3,4,5 ශ්‍රේණි සඳහා)</u>

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ කුසලතා සහතික - 10

### 1.1.3 <u>කනිෂ්ඨ අංශය (6,7,8 ශ්‍රේණි සඳහා)</u>

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ කුසලතා සහතික - 10

### 1.1.4 <u>ජ්‍යෙෂ්ඨ අංශය (9,10,11ශ්‍රේණි සඳහා)</u>

- ❖ ප්‍රථම ස්ථානය -
- ❖ දෙවන ස්ථානය -
- ❖ තෙවන ස්ථානය -
- ❖ කුසලතා සහතික - 10

### 1.1.5 <u>ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය (12,13 ශ්‍රේණි සඳහා)</u>

- ❖ ප්‍රථම ස්ථානය -
- ❖ දෙවන ස්ථානය -
- ❖ තෙවන ස්ථානය -
- ❖ කුසලතා සහතික - 10

### 1.1.6 <u>විවෘත අංශය (අවුරුදු 18 ට වැඩි)</u>

- ❖ ප්‍රථම ස්ථානය -
- ❖ දෙවන ස්ථානය -
- ❖ තෙවන ස්ථානය -
- ❖ කුසලතා සහතික - 10
- ❖ **චිත්‍ර තරග ප්‍රථම ස්ථාන සඳහා ජය සංකේත පිරිනැමේ.**

## 1.2 <u>මූර්ති, කැටයම් හා ගොක් කොළ නිර්මාණ තරඟය</u>

මේ සඳහා ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ වශයෙන් කොටස් 02 කි. ජ්‍යෙෂ්ඨ අංශය අවුරුදු 18 න් ඉහළ ද කනිෂ්ඨ අංශය අවුරුදු 18 හා 18 න් පහල ද වශයෙන් තරගකරුවන්ට ඉදිරිපත් විය හැකිය.

### 1.2.1 <u>මූර්ති තරගය</u>

**ඇඹීම හා නෙළීම යන අංශ දෙක ඔස්සේ නිර්මාණය ඉදිරිපත් කළ හැකිය.**

- **ඇඹීම සඳහා යොදා ගත හැකි මාධ්‍යයන්.**

කිරි මැටි, කඩදාසි පල්ප ඇතුළු තමාට අවශ්‍ය ඕනෑම ද්‍රව්‍යයක් යොදා ගත හැකිය. එහෙත් එම යොදා ගනු ලබන ඕනෑම මාධ්‍යයකින් ඇඹීම කළ යුත්තේ දෙන ලද මාතෘකාවට/තේමාවට අදාළ වන පරිදි වූ නිර්මාණයක් පමණි.

- **නෙළීම සඳහා යොදා ගත හැකි මාධ්‍යයන්.**

දැව (ලී කොට), ඝන රිජිෆෝම්, සබන් කැට ඇතුළු තමාට අවශ්‍ය ඕනෑම ද්‍රව්‍යයක් යොදා ගත හැකිය. එහෙත්, එම යොදා ගනු ලබන ඕනෑම මාධ්‍යයකින් නෙළීම කළ යුත්තේ දෙන ලද මාතෘකාවට/තේමාවට අදාළ වන පරිදි වූ නිර්මාණයක් පමණි.

### 1.2.2 <u>කැටයම් තරගය</u>

- **කැටයම් නිර්මාණ සඳහා යොදා ගත හැකි මාධ්‍යයන්.**

ලෑලි කෑලි, රිජිෆෝම්, ඝන කාඩ්බෝඩ් ඇතුළු තමාට අවශ්‍ය ඕනෑම ද්‍රව්‍යයක් යොදා ගත හැකිය. එහෙත්, එම යොදා ගනු ලබන ඕනෑම මාධ්‍යයකින් දෙන ලද මාතෘකාවට/තේමාවට අදාළ කැටයම් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කළ යුතුය.

### 1.2.3 <u>ගොක් කොළ නිර්මාණ තරගය</u>

- **ගොක් කොළ නිර්මාණ සඳහා යොදා ගත හැකි මාධ්‍යයන්.**

කෙසෙල් කොට, පතුරු, හබරල කොළ, පොල් කොළ ඇතුළු තමාට අවශ්‍ය ඕනෑම ද්‍රව්‍යයක් යොදා ගත හැකිය. එහෙත්, යොදා ගනු ලබන ඕනෑම ද්‍රව්‍යයකින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණය සාම්ප්‍රදායික ගොක් කොළ නිර්මාණ තරඟ අංශයටම අදාළ විය යුතුය. ඒ පිළිබඳව විනිශ්චය මණ්ඩලය සෑහීමකට පත්විය යුතුය.

**ඉහත තරග ඉසව් 03 සඳහා පහත පරිදි ත්‍යාග පිරිනමනු ලැබේ.**

**ත්‍යාග.**

| | ජ්‍යෙෂ්ඨ අංශය | කනිෂ්ඨ අංශය |
|---|---|---|

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය
- **ප්‍රථම ස්ථානය සඳහා ජය සංකේත පිරිනැමේ**
- **කුසලතා සහතික 03 කි.**

**<u>සංගීත සහ නර්තන තරඟ සඳහා පොදු කොන්දේසි</u>**

- ❖ තරගය සඳහා ඉදිරිපත් වන සෑම ශිල්පියෙක්ම උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර, එසේ ස්ථිර පදිංචි බව සනාථ නොවුනහොත්, තරගයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
- ❖ තරග සඳහා සහභාගි වන සෑම ශිල්පියෙක්ම තම උප්පැන්න සහතිකයේ පිටපතක් රැගෙන ආ යුතුය.
- ❖ තරග සඳහා පැමිණෙන ශිල්පීන්, තරග භූමිය තුළ පුහුණුවීම් කටයුතුවල නිරත නොවිය යුතු අතර, තරගය සඳහා දී ඇති නියමිත වේලාව තුළ තම තරග ඉසව්ව ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන තරග ඉසව් තරගයෙන් ඉවත් කරනු ලැබේ.
- ❖ තරගකරුවන් විසින් තමාගේ තරග ඉසව්ව සඳහා ඉදිරිපත් වන ශිල්පීන්ගේ නාම ලේඛනය (සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, අත්සන සහිතව) සකසා අයදුම් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.
- ❖ තරග පැවැත්වෙන දිනය හා ස්ථානය පසුව දැනුම් දෙනු ලැබේ.

## 02. <u>ගායන හා වාදන තරඟ</u>

මෙම තරගය සඳහා ඉදිරිපත් වන එක් තරගකරුවෙක් හෝ කණ්ඩායමක් තමා ඉදිරිපත් වන තරග ඉසව්වට අදාළව, ඉදිරිපත් විය හැක්කේ එක් ආයතනයක් (පාසල්, දහම් පාසල්,පිරිවෙන්, කලායතන) නියෝජනය වන පරිදිය. නමුත් එම තරගකරුවාට හෝ කණ්ඩායමට වෙනත් තරග ඉසව්වකින් වෙනත් ආයතනයකින් ඉදිරිපත් විය හැකිය.

**සැ.යු.**

- මීට පෙර වෙනත් **<u>ජාතික තලයේ තරඟ සඳහා ඉදිරිපත් කළ ජයග්‍රහණය නොලැබූ</u>** නිර්මාණ විය යුතුය.
- සංගීත තරග සඳහා ඉදිරිපත් වන කලායතන ලියාපදිංචි හා ලියාපදිංචි තත්ත්වයේ පවතින කලායතන විය යුතුය.
- ලියාපදිංචි තත්ත්වයේ පවතින සංගීත කලායතන සම්බන්ධයෙන් ගැටළු මතු වුවහොත්, පළාත් සංස්කෘතික නිලධාරීන්ගේ නිර්දේශයන් මත අවසාන තීරණය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂ සතු වේ.

## <u>2.1 ශාස්ත්‍රීය ගායනා - ඒකල (විවෘත)</u>

- ❖ මේ සඳහා හින්දුස්ථානි රාගයකට අයත් විලම්භ ලය හා මධ්‍ය ලය, ඛ්‍යාල් ගීත පදනම්කොට ගායනා ඉදිරිපත් කළ යුතුය.
- ❖ ආලාප, මධ්‍ය ආලාප හා තානාලංකාර ගායනය අත්‍යවශ්‍ය බව සලකන්න. (සැ.යු. බෝල් ආලාප හා බෝල් තාන් ආදී ශාස්ත්‍රීය අංග ඇතුළත් කොට ගායනය ඉදිරිපත් කිරීම වැඩි සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)
- ❖ සහාය වාදනය සඳහා ශ්‍රැතිය මත වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩයක්/ තබ්ලාව අනිවාර්ය වන අතර, ඊට අමතරව වයලීනය හෝ එස්රාජය වැනි භාණ්ඩ ගායනයට බාධා නොවන පරිදි යොදා ගත හැකිය.
- ❖ ඉදිරිපත් විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි..(තරගකරු ඇතුළුව)
- ❖ කාලය අවමය විනාඩි 05 කි. උපරිමය විනාඩි 07 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 2.2. <u>ජන ගායනා - ඒකල (විවෘත)</u>

- ❖ මේ සඳහා ප්‍රාථමික/කනිෂ්ඨ /ජ්‍යෙෂ්ඨ වශයෙන් කොටස් 03 කි. ප්‍රාථමික අංශය අවුරුදු 12 න් පහළද, කනිෂ්ඨ අංශය අවුරුදු 12 ත් 18 ත් අතරද, ජ්‍යෙෂ්ඨ අංශය අවුරුදු 18ට වැඩි වශයෙන් තරගකරුවන්ට ඉදිරිපත් විය හැකිය.
- ❖ මේ සඳහා නිර්දේශිත ජන ගී පහත දැක්වේ.
  - ගැල්/පැල්/පාරු/බඹර/පතල්/කුරක්කන්/ඇඹරුම් සිව් පද
  - ගොයම්/නෙළුම්/කමත්/පන් සිව් පද
  - ප්‍රශස්ති/වන්නම්/සංදේශ කාව්‍ය /හටන් ගී
  - ශාන්ති කර්ම ගී/වැලපුම් ගී/නැළවිලි ගී
- ❖ නිර්දේශිත ජන ගී සමූහ හතර අතරින් එක් සමූහයකින් එක් ගීතයක් ඇතුළත් වන පරිදි ගීත තුනක් ගායනා කිරීම අනිවාර්ය වේ. සාම්ප්‍රදායික නාද මාලා හා අප්‍රකට ගීත කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
- ❖ තාලම්පට/උඩැක්කිය/ගැටබෙරය/පහතරට බෙරය/දවුල යන වාද්‍ය භාණ්ඩ පමණක් සහාය වාදනය සඳහා යොදා ගත හැකිය.
- ❖ තරගකරු හැර සහභාගි විය හැකි සහාය වාදකයින්ගේ උපරිම සංඛ්‍යාව 06 කි.
- ❖ කාලය අවමය විනාඩි 03 කි. උපරිමය විනාඩි 05 කි.

**ත්‍යාග.**

| | **ජ්‍යෙෂ්ඨ අංශය** | **කනිෂ්ඨ අංශය** |
|---|---|---|
| ❖ ප්‍රථම ස්ථානය | | |
| ❖ දෙවන ස්ථානය | | |
| ❖ තෙවන ස්ථානය | | |

## 2.3. <u>ජන ගායනා සාම්ප්‍රදායික - ඒකල (වයස අවුරුදු 50 ට වැඩි)</u>

- ❖ සාම්ප්‍රදායික ජන ගායනා පමණක් ඉදිරිපත් කළ යුතුය.
- ❖ උඩරට බෙරය /පහතරට බෙරය/ දවුල/ තම්මැට්ටම/ උඩැක්කිය/ රබාන සහ තාලම්පට සහාය වාදනය සඳහා භාවිතා කළ හැකිය.
- ❖ කාලය අවමය විනාඩි 03 කි. උපරිමය විනාඩි 05 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 2.4. ශාස්ත්‍රීය වාදන ඒකල (විවෘත)

මෙම තරගය ස්වර වාදන, තාල වාදන යනුවෙන් කොටස් දෙකකි.

### 2.4.1 ස්වර වාදන (ඒකල)

- මේ සඳහා වයලීනය/සිතාරය/එස්රාජය/බටනලාව වැනි භාණ්ඩ උපයෝගී කර ගත හැකිය.
- භාණ්ඩ වර්ගීකරණය අනුව වෙන වෙනම තරග පැවැත්වේ. හින්දුස්ථානි රාගයකට අයත් විලම්භ ලය, මධ්‍ය ලය, ධ්‍රැත ලය, ගීත හෝ වාදිත (ගත්) පදනම් කොට ගෙන වාදනය ඉදිරිපත් කළ යුතුය.
- ආලාප, මධ්‍ය ආලාප, තානාලංකාර හා ජලා යන ශාස්ත්‍රීය අංග ඇතුළත් වන පරිදි වාදනය ඉදිරිපත් කළ යුතුය.
- සහාය වාදනය සඳහා තබ්ලාව සහ ශ්‍රැති වාද්‍ය භාණ්ඩ අනිවාර්යෙන් යොදා ගත යුතුය. ඊට අමතරව තාම්පුරාව/ස්වර මණ්ඩලය හා සර්පිනාව (හාර්මෝනියම්) යන භාණ්ඩ යොදා ගත හැකිය.
- ඉදිරිපත් විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. (තරගකරු ඇතුළුව)
- කාලය අවමය විනාඩි 05 කි. උපරිමය විනාඩි 07 කි.

**ත්‍යාග.**

#### 2.4.1.1. වයලීනය
- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

#### 2.4.1.2. එස්රාජය

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

#### 2.4.1.3. බටනලාව

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

#### 2.4.1.4 සිතාරය

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

### 2.4.2 තාල වාදන - තබ්ලා (ඒකල)

- සහාය වාදනය සඳහා හාර්මෝනියම් (සර්පිනාව) වයලීනය, එස්රාජය යන භාණ්ඩ යොදා ගත හැකිය.

- ලෙහෙරා වාදනය අනිවාර්යයෙන් යොදා ගත යුතුය.
- තබ්ලා ඒකල වාදනයක අනුපිළිවෙල සහ එහි අන්තර්ගත විය යුතු පද වර්ග නියමිත පරිදි භාවිතා කළ යුතුය.
- ඉදිරිපත් විය හැකි උපරිම සංඛ්‍යාව තිදෙනෙකි. (තරගකරු ඇතුළුව)
- කාලය අවමය විනාඩි 07 කි. උපරිමය විනාඩි 10 කි.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

## 2.5. වේදිකා නාට්‍ය ගී - ඒකල (විවෘත)

- රංග උපකරණ , ඇඳුම්, වේශ නිරූපණය සහ අවස්ථා නිරූපණය අපේක්ෂා කෙරේ.
- සහාය ගායන ශිල්පීන් යොදා ගත හැකිය.
- වාදක මණ්ඩලය සමඟ සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
- තමන් කැමති ඕනෑම වේදිකා නාට්‍ය ගීයක් තෝරා ගත හැක.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

## 2.6 ළමා ගී - ඒකල

- වයස අවුරුදු 12 සහ 12ට අඩු තරගකරුවන්ට මේ සඳහා ඉදිරිපත් විය හැකිය.
- සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතුය.
- වාදනය අවශ්‍ය වන අතර, ආරම්භක හා අන්තර් සංගීතය සොයා ගැනීමට නොහැකි නම් ගීතයේ කොටසක් වාදනය සඳහා යොදා ගත හැකිය.
- වාදක මණ්ඩලය සමඟ සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
- තමා කැමති ළමා ගීයක් ඉදිරිපත් කළ හැක

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

## 2.7 නව නිර්මාණ ගායනා - සමූහ (විවෘත)

- "**සුළඟ**" යන තේමාව ප්‍රමුඛ වන පද රචනයක් විය යුතුය.
- ගීතයේ පද රචනය, තනුව, සංගීත සංයෝජනය නව නිර්මාණ විය යුතුය.
- අංග චලනය ගායනයට බාධා නොවන පරිදි ප්‍රකාශනාත්මකව යොදා ගත හැකිය.

❖ කණ්ඩායමකට සහභාගි විය හැකි අවමය 15 කි. උපරිමය 25 කි. (වාදක මණ්ඩලය සමඟ)
❖ කාලය අවමය විනාඩි 04 කි. උපරිමය විනාඩි 07 කි.

**ත්‍යාග.**

❖ ප්‍රථම ස්ථානය
❖ දෙවන ස්ථානය
❖ තෙවන ස්ථානය

## 2.8 ශාස්ත්‍රීය ගායනා සමූහ (විවෘත)

❖ මේ සඳහා හින්දුස්ථානී රාගයකට අයත් විලම්භ ලය හා මධ්‍ය ලය පදනම් කොට ගායනය ඉදිරිපත් කළ හැකිය.
❖ ආලාප, මධ්‍ය ආලාප හා තානාලංකාර ගායනය අත්‍යවශ්‍ය බව සලකන්න. (සැ.යු. බෝල් ආලාප හා බෝල් තාන් ආදී ශාස්ත්‍රීය අංග ඇතුළත් කොට ගායනය ඉදිරිපත් කිරීම වැඩි සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)
❖ සහාය වාදනය සඳහා ශ්‍රැතිය මත වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩයක්/ තබ්ලාව අනිවාර්ය වන අතර, ඊට අමතරව තාම්පුරාව/ස්වර මණ්ඩලය/වයලීනය හෝ එස්රාජය/හාර්මෝනියම් (සර්පිනාව) යන භාණ්ඩ ගායනයට බාධා නොවන පරිදි යොදා ගත හැකිය.
❖ කණ්ඩායමකට ඉදිරිපත් විය හැකි අවම සංඛ්‍යාව 15 කි. උපරිම සංඛ්‍යාව 25 කි. (වාදක මණ්ඩලය සමඟ)
❖ කාලය අවමය විනාඩි 05 කි. උපරිමය විනාඩි 08 කි.

**ත්‍යාග.**

❖ ප්‍රථම ස්ථානය
❖ දෙවන ස්ථානය
❖ තෙවන ස්ථානය

## 2.9. ජන ගී ප්‍රතිනිර්මාණ සමූහ (විවෘත)

මේ සඳහා නිර්දේශිත ජන ගී පහත පරිදි වේ. එම නිර්දේශිත ජන ගී අතරින් සමූහ 03 ක් නියෝජනය වන පරිදි තෝරා ගත යුතුය.

- ගොයම්/නෙළුම් ඕස/අඬහැර/තෙතගු
- ප්‍රශස්ති/වන්නම්/සංදේශ කාව්‍ය/හටන් ගී
- ශාන්ති කර්ම ගී/ජන ක්‍රීඩා ආශ්‍රිත ගී/රබන් ගී/ඔන්චිලි වාරම්
- බඹර/කුරහන්/ටීකා සී පද/පතල්/පාරු
- ආගමික ගායනා (බෞද්ධ /ක්‍රිස්තියානි)

❖ මෙම තරගය සඳහා ගැහැණු, පිරිමි වශයෙන් වර්ග නොකෙරේ.
❖ සාම්ප්‍රදායික ලක්ෂණ (ශෛලිය) ආරක්ෂා වන පරිදි ඕනෑම වාද්‍ය භාණ්ඩයක් භාවිතා කළ හැකිය.
❖ සාම්ප්‍රදායික (තනු) ගායන ශෛලිය ආරක්ෂා විය යුතුය.

- ඕනෑම සංගීත සම්ප්‍රදායකට අයත් සංගීත ශිල්ප ක්‍රම උචිත පරිදි භාවිතා කළ හැකිය.
- ඉදිරිපත් විය හැකි සංඛ්‍යාව වාදක මණ්ඩලය සමග අවමය 10 ක් වන අතර, උපරිමය 20 කි.
- ගායනයට බාධා නොවනසේ අංග චලන යොදා ගත හැකිය.
- කාලය අවමය විනාඩි 04 කි. උපරිමය විනාඩි 06 කි.

ත්‍යාග.

- ප්‍රථම ස්ථානය
- දෙවන  ස්ථානය
- තෙවන ස්ථානය

## 2.10. නව නිර්මාණ වාදන සමූහ (විවෘත)

- මේ සඳහා දේශීය විදේශීය සංගීත භාණ්ඩ වලට අමතරව නිර්මාණය කර ගන්නා ලද වාද්‍ය භාණ්ඩ ද යොදා ගත හැකි අතර, එම නිර්මාණය කර ගන්නා ලද වාද්‍ය භාණ්ඩ අනෙකුත් ස්වර වාද්‍ය භාණ්ඩ වලට අනුව සකසා (සුසර කර) ගත යුතුය.
- නිර්මාණය " **සොබාදහමේ අසිරිය** " යන තේමාව යටතේ ඉදිරිපත් කළ යුතුය.
- පෙරදිග, බටහිර සමූහ වාදන ශිල්ප ක්‍රම භාවිතා කිරීමේ නිදහස ඇත.
- අවශ්‍ය තැන් වලදී කටහඬින් නාද  භාවිතා කළ හැකිය.
- ඉදිරිපත් විය හැකි අවම සංඛ්‍යාව 10 කි. උපරිම සංඛ්‍යාව 30 කි.
- කාලය අවමය විනාඩි 05 කි. උපරිමය විනාඩි 08 කි.

ත්‍යාග.

- ප්‍රථම ස්ථානය
- දෙවන  ස්ථානය
- තෙවන ස්ථානය

## 2.11. නූර්ති හා නාඩගම් ගී -  සමූහ (විවෘත)

- මෙම තරගය සඳහා නූර්ති ගීයකුත් නාඩගම් ගීයකුත් ගායනා කළ යුතුය. අප්‍රකට ගීත කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.
- සහාය වාදනය සඳහා හාර්මෝනියම් (සර්පිනා), තබ්ලාව සහ මද්දලය යොදා ගත යුතු අතර, ඊට අමතරව උචිත භාණ්ඩ යොදා  ගත හැකිය.
- රංග වින්‍යාසය ශෛලියට උචිත පරිදි යොදා ගත යුතු අතර, එය ගායනයට බාධාවක් නොවිය යුතුය.

- ඉදිරිපත් විය හැකි සංඛ්‍යාව අවමය 10 කි. උපරිමය 20 කි. (වාදක මණ්ඩලය සමඟ)
- කාලය අවමය විනාඩි 06 කි. උපරිමය විනාඩි 10 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 2.12 <u>පැරණි ගී - සමූහ (විවෘත)</u>

- ❖ 70 දශකයට පෙර මෙරට ප්‍රචාරය වූ සිංහල බසින් රචිත ගීත නිර්මාණ මේ සඳහා භාවිතා කළ හැකිය.
- ❖ ගායනයට හානි නොවන පරිදි අංග චලනය යොදා ගත හැකිය.
- ❖ උචිත පරිදි සහය වාදකයින් යොදා ගත හැකිය.
- ❖ ඉදිරිපත් විය හැකි අවම සංඛ්‍යාව 10 කි. උපරිම සංඛ්‍යාව 25 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 2.13 <u>හින්දි චිත්‍රපට ගී - සමූහ (විවෘත)</u>

- ❖ නම් කොට ඇති චිත්‍රපට අතරින් කැමති ගීතයක් තෝරා ගෙන පෙරවාදන, අතුරුවාදන ආදි ශිල්පාංග සමග මුල් නාද මාලාවට හානි නොවන පරිදි සමූහ ගායනා අංග වලින් විචිත්‍ර කොට ඉදිරිපත් කළ යුතුය.
- ❖ ගායනයට හානි නොවන සේ ප්‍රකාශනාත්මක චලන යොදා විචිත්‍රවත් කළ හැක.
- ❖ කාලය - ගීතයට අදාළ කාලය ලෙස සලකන්න
- ❖ සහභාගී විය හැකි <u>සංඛ්‍යාව</u> - වාදක මණ්ඩලය හැර අවමය 10 කි වාදන මණ්ඩලය සමග උපරිමය 25 කි.
- ❖ වාදක මණ්ඩලයට ගායනයට සහභාගී විය නොහැක.
- ❖ මධුමති , සාජන්, අභිමාන්, ගවාර්, ආරාධනා, දොස්ති, දුලාරි, ගීත් යන චිත්‍රපට වලින් සුදුසු ගීතයක් විය යුතුය.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 2.14 <u>හොඳම සංගීත කලායතනය තේරීමේ තරගය</u>

- ❖ මෙම තරගය සඳහා සහභාගී වන කලායතන ලියාපදිංචි හා ලියාපදිංචි තත්ත්වයේ පවතින කලායතන විය යුතුය.
- ❖ පහත සඳහන් තරග ඉසව් සඳහා ලබා ගන්නා ලකුණු මත හොඳම සංගීත කලායතනය තෝරනු ලැබේ.

- නව නිර්මාණ ගායනා - සමූහ (විවෘත)
- ශාස්ත්‍රීය ගායනා - සමූහ (විවෘත)
- ජන ගී ප්‍රතිනිර්මාණ - සමූහ (විවෘත)
- නව නිර්මාණ වාදන - සමූහ (විවෘත)
- නූර්ති හා නාඩගම් ගී සමූහ - (විවෘත)
- පැරණි ගී සමූහ - (විවෘත)
- පැරණි හින්දි ගී සමූහ - (විවෘත)

❖ ප්‍රථම ස්ථානය සඳහා ලකුණු 15 ක්ද දෙවන ස්ථානය සඳහා ලකුණු 10 ක්ද තෙවන ස්ථානය සඳහා ලකුණු 05 ක්ද යන පදනම මත ඇගයීම් කර වැඩිම ලකුණු ලබා ගන්නා ලද කලායතනය සඳහා පහත සඳහන් අයුරින් ත්‍යාග සහ සහතික පත් පිරිනමනු ලැබේ.

**ත්‍යාග.**

❖ ප්‍රථම ස්ථානය
❖ දෙවන ස්ථානය
❖ තෙවන ස්ථානය
❖ **ප්‍රථම දෙවන,තෙවන,ස්ථාන සඳහා ජය සංකේත පිරිනැමේ**

## 03. <u>සාහිත්‍ය තරඟ (විවෘත)</u>

**සැ.යු.**

මෙම තරග සඳහා ඉදිරිපත් වන නිර්මාණ කරුවන් පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමුකොට තම නිර්මාණ ඉදිරිපත් කරන ලෙස අවධාරණය කෙරේ.සාහිත්‍ය තරග සඳහා වන මෙම පොදු කොන්දේසි වලට අනුකූලව ඉදිරිපත් නොකරන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ඇත.

❖ මෙහි සඳහන් 3.1 සිට 3.8 දක්වා වූ සියළුම තරග සඳහා එක් නිර්මාණ කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් තරග අංශයකින් එක් නිර්මාණයක් පමණි.
❖ තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙතෙක් කිසිදු මාධ්‍යකින් ප්‍රකාශිත නොවූ ඒවා විය යුතු අතර මින් පෙර පළවූ අන් අයකුගේ නිර්මාණයක් වීමද නොවිය යුතුය.ත්‍යාග ප්‍රධානයෙන් පසුව වුවද ඒ බව හෙළි වුවහොත් අදාළ ජයග්‍රහණයන් අවලංගු කිරීමට අදාළ කටයුතු සිදු කෙරේ.
❖ ඉදිරිපත් කරන නිර්මාණ පිටපත නම,ලිපිනය,දුරකතන අංක,පෙර වදන්,ස්තුති කිරීම්,පිදුම,වෙනත් හැඳින්වීම් ආදි කිසිවක් සඳහන් නොකළ යුතුය.එය නිර්මාණය ප්‍රතික්ෂේප වීමට හේතුවක් වනු ඇත.
❖ අයදුම්පතේ නිවැරදි තොරතුරු හා තරග ඉසව්ව,නිර්මාණයේ තේමාව හෝ මාතෘකාව මනා අවධානයකින් නිවරදිව සඳහන් කළ යුතු වේ.
❖ සියළුම නිර්මාණ යතුරු ලියන (ඒ4) කඩදාසියේ තනි පැත්ත භාවිතා කර පරිගණක මුද්‍රණයෙන් හෝ ඉතාමත් පැහැදිලි අත් අකුරින් ඉදිරිපත් කළ යුතු වේ.මුද්‍රිත අකුරු නම් එෆ්.එම්.අභය 12 වඩා කුඩා ප්‍රමාණයට වඩා නොවිය යුතුය.
❖ යොවුන් නව කථා,කෙටිකතා,පද්‍ය සංග්‍රහ ,ගීත රචනා සංග්‍රහයන්හි නිවැරදිව පිටු අංක කළ යුතුය.

- අපිළිවෙලට කටු ගැසූ ,පිටු ඉරී යන සේ නූල්වලින් බැඳි නිර්මාණ සංග්‍රහ ඉදිරිපත් නොකරන මෙන් අවධාරණය කෙරේ.එහත් අධික වියදම් දරා මුද්‍රිත කවර යොදා සෙලෝප්ලේන්,ප්ලාස්ටික් පේපර් වැනි කවර යොදා ගැනීම හෝ වයර් ,බයින්ඩින් වැනි ක්‍රම අත්‍යාවශ්‍ය නොවේ.ඒවා නිර්මාණ සමීක්ෂණ වලදී අපහසුතා ඇති කරන අතර නිර්මාණයට ලකුණු ලබා දීම කිසිසේත් නොසැලකේ.
- එක් එක් තරග ඉසව් සඳහා ඇති විශේෂ නිර්ණායක ගැන සැලකිළිමත් වන්න.කලා උළෙලේ තරගයට ඇති පොදු කොන්දේසි ද අදාළ වේ.

## 3.1 <u>යොවුන් නව කථා අත්පිටපත් තරගය (විවෘත)</u>

- යොවුන් පාඨකයින්ට උචිත විෂයානුබද්ධ බව අන්තර්ගතයේ සාමාජීය වටිනාකම හා යොවුන් චින්තනයේ සංකල්ප හැකියා වර්ධනය හා පෙළඹවීම, උචිත වාග් මාලාව හා කියවීමේ රුචිය ඇති කරවීම වැනි යොවුන් නවකථාවක තිබිය යුත ගුණාංග අපේක්ෂා කෙරේ.

- මුද්‍රිත පිටු 50 සිට 75 හා අතින් ලියන ලද පිටු 75 සිට 100 නිර්මාණයක් ඉදිරිපත් කළ යුතුය.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

- **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
- **කුසලතා සහතික** (කුසලතා - නිර්මාණවල ස්වභාවය අනුව තීරණය වේ.)

## 3.2 <u>කෙටි කථා තරගය - සිංහල හා දෙමළ මාධ්‍ය</u>

- තේමාවේ නව නිර්මාණාත්මක බව ධාරණාව චරිත නිර්මාණය,බස්වහර වැනි අංග සැළකිල්ලට ගනු ගැනේ. මුද්‍රිත පිටු 10 හෝ අතින් ලියන ලද පිටු 12 ට නොවැඩි කෙටි කලාවක් විය යුතුය.

ත්‍යාග

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය
- **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
  **කුසලතා සහතික 03**

## 3.3 <u>කෙටි කථා සංග්‍රහ තරඟය</u>

- යතුරු ලියන(ඒ4) තනි පිටුවේ මුද්‍රිත කෙටි කතා 8 සිට 10 ප්‍රමාණයක් විය යුතු අතර අවම පිටු ප්‍රමාණය 50 විය යුතුය.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

- ❖ **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
- ❖ **කුසලතා සහතික** (කුසලතා - නිර්මාණවල ස්වභාවය අනුව තීරණය වේ.)

## 3.4 පද්‍ය රචනා තරගය සඳැස්,නිසඳැස් - සිංහල හා දෙමළ මාධ්‍ය

- ❖ කාව්‍යොක්ති උපමා,උපමේය නව ලේඛණ රටා හා සංකල්ප,බස හැසිරවීම ආදි ගුණාංගයන් සලකා බැලේ .සදැස් නිර්මාණයක් පද්‍ය 6-10 අතර විය යුතුය.

**ත්‍යාග.**

**සඳැස්** **නිසඳැස්**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
- ❖ **කුසලතා සහතික 03**

## 3.5 පද්‍ය රචනා සංග්‍රහය තරගය

පද්‍ය රචනා තරගය,සඳැස්,නිසඳැස්,හෝ මිශ්‍ර නිර්මාණ සංග්‍රහයන් ඉදිරිපත් කළ හැක.අවම පිටු 45 ක් විය යුතුය.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
- ❖ **කුසලතා සහතික (නිර්මාණයේ ස්වභාවය අනුව තීරණය කෙරේ.)**

## 3.6 ගී පද රචනා තරගය - සිංහල දෙමළ මාධ්‍ය

නව නිර්මාණාත්මක සංකල්පයක් වීම,එයට උචිත භාෂා භාවිතය(සුගායණීය වචන) සංෂිප්ත බව පවත්නා පද වැලක අනුකාරක පදවැලක් නොවීම වැනි ගුණාංගයන් සැලකිල්ලට ගැනේ.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
- ❖ **කුසලතා සම්මාන 03**

## 3.7 ගී පද රචනා සංග්‍රහය තරඟය

1.6 හි සඳහන් වන අයුරු රචනය කරන ලද පද මාලා 40 ක් අවම වශයෙන් තිබිය යුතු වේ.සංග්‍රහයේ අඩංගු උසස් පද මාලාවේ සංඛ්‍යාව ලකුණු ලබා දීමේදි සැලකිල්ලට ගැනේ.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය
- **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
- **කුසලතා සහතික (නිර්මාණයේ ස්වභාවය අනුව තීරණය කෙරේ.)**

## 3.8 ළමා කතන්දර පොත් අත් පිටපත් තරගය - සිංහල හා දෙමළ මාධ්‍ය

කතන්දරය කිනම් වයස් කාණ්ඩයක උදෙසාදැයි සඳහන් විය යුතුය.නිර්මාණයේ අකුරු වල ප්‍රමාණය ,පිටු ගණන,අන්තර්ගතය,චිත්‍ර,වාග්මාලාව වයස් ප්‍රමාණයට උචිත විය යුතුය.
චිත්‍ර පිටු 4 ක් සමග මුද්‍රිත යතුරු ලියන (ඒ4) පිටු 12ක් අවම පිටු ප්‍රමාණය වේ.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය
- **ප්‍රථම ස්ථානයට ජය සංකේත පිරිනැමේ**
- **කුසලතා සහතික (නිර්මාණයේ ස්වභාවය අනුව තීරණය කෙරේ.)**

# 04. කලායතන තරග (නර්තන) කොන්දේසි

- උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.
- මෙම තරගය "ඒ" හා "බී" වශයෙන් කොටස් දෙකකට වර්ග කර ඇති අතර, කලායතනයෙන් ඉදිරිපත් විය යුත්තේ "ඒ" කොටසේ හෝ "බී" කොටසේ තරග වලට පමණි.
- "ඒ" ශ්‍රේණියේ කලායතන වලට "බී" කොටසේ තරග සඳහා හෝ "බී" ශ්‍රේණියේ කලායතන වලට "ඒ" කොටසේ තරග සඳහා හෝ ඉදිරිපත් විය නොහැක.
- පසුගිය වසරවල "ඒ" කොටස සඳහා ඉදිරිපත් වූ කලායතන ද 2019 වසරේ "බී" කොටස සඳහා ඉදිරිපත් වී හොඳම කලායතනය ලෙස තේරී පත් වූ කලායතනය ද මෙවර "ඒ" කොටස සඳහා තරග කළ යුතුය.
- මෙතෙක් උතුරු මැද කලා උළෙල හා සම්බන්ධ වූ අනෙකුත් සියළුම කලායතන වලට "බී" කොටසේ තරග සඳහා ඉදිරිපත් විය හැකිය.
- හොඳම කලායතනය තේරීමේ තරගයේදී "ඒ" කොටසේ තරග සඳහා "ඒ" ශ්‍රේණියේ කලායතන වලටද "බී" කොටසේ තරග සඳහා "බී" ශ්‍රේණියේ කලායතන වලටද ඉදිරිපත් විය හැකිය.
- මෙම තරගය සඳහා තරග ඉසව් 07 ක් පැවැත්වෙන අතර, එක් කලායතනයකින් තරග කළ යුත්තේ ඉසව් 05 කට පමණි. (පහත සඳහන් ඉසව්වන්ට අදාල අංගයන්ගෙන් එක් අංගයක් නියෝජනය වන පරිදිය)
- හොඳම කලායතනය තේරීම සඳහා පහත සඳහන් තරග ශීර්ෂ සැළකිල්ලට ගනු ලැබේ.

- උඩරට ශාස්ත්‍රීය නැටුම්
- පහතරට ශාස්ත්‍රීය නැටුම්
- සබරගමු ශාස්ත්‍රීය නැටුම්
- සාම්ප්‍රදායික වන්නම්
- ජන නැටුම්
- බලි ශාන්ති කර්ම - සමූහ
- හේවිසි වාදනය

❖ ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍ර වල "ඒ" කොටසද "බී" කොටසද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය

❖ "ඒ" කොටසේ හා "බී" කොටසේ කලායතන සඳහා වන තරග වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

**සැ.යු.** "ඒ" කොටසේ තරග සඳහා විශ්ව විද්‍යාල සිසුන් ඇතුළත් කර නොගත යුතුය.

## 4.1 "<u>ඒ</u>" <u>කොටසේ කලායතන තරග</u>

### I. උඩරට ශාස්ත්‍රීය නැටුම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | තිත් මාත්‍රා |
| පිරිමි | - | යක් ඇන්නුම |
| මිශ්‍ර | - | යක්තුන් පදය |

### II. සාම්ප්‍රදායික වන්නම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | සුරපති වන්නම |
| පිරිමි | - | අසදෘශ වන්නම |
| මිශ්‍ර | - | ගාහක වන්නම |

### III. පහතරට ශාස්ත්‍රීය නැටුම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | නානු මුරය |
| පිරිමි | - | ලිච්චවි |
| මිශ්‍ර | - | පන්දම් පද |

### IV. සබරගමු ශාස්ත්‍රීය නැටුම් (සමූහ) - විවෘත

| | | | |
|---|---|---|---|
| **V.** | ගැහැණු | - | කොවුලා වන්නම |
| | පිරිමි | - | සින්දු මාත්‍රය |
| | මිශ්‍ර | - | මිශ්‍ර යහන් දැක්ම |

## VI. ජන නැටුම්

| | | |
|---|---|---|
| ගැහැණු | - | කොහු කර්මාන්තය ආශ්‍රයෙන් |
| පිරිමි | - | පතල් කර්මාන්තය ආශ්‍රයෙන් |
| මිශ්‍ර | - | ධීවර කර්මාන්තය ආශ්‍රයෙන් |

## VII. බලි ශාන්ති කර්ම - සමූහ

- ❖ විවිධ තාල හා නාද මාලා සහිත බලි කවි, සන්න කවි, ග්‍රහ පංති කවි,මඩු සැරසිලි කවි ආදිය අවශ්‍ය පරිදි භාවිතා කළ හැකිය.
- ❖ අභිමත පරිදි එක් සම්ප්‍රදායක් යොදා ගත හැකිය.
- ❖ ගැහැණු, පිරිමි, මිශ්‍ර වශයෙන් ඉදිරිපත් විය හැකිය.
- ❖ සහභාගි වන ශිල්පීන් සංඛ්‍යාව 06 ට නොඅඩු 10 ට නොවැඩි විය යුතුය. වාදන ශිල්පීන් මෙම සංඛ්‍යාවට ඇතුළත් නොවේ.
- ❖ අවම කාලය විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.
- ❖ අවශ්‍ය වන්නේ නම් බලි රූප, බලි මැස්ස ආදිය රංග භාණ්ඩ ලෙස භාවිතා කළ හැකිය.

## VII. හේවිසි වාදනය - සමූහ

- ❖ ගැහැණු, පිරිමි, මිශ්‍ර වශයෙන් ඉදිරිපත් විය හැකිය.
- ❖ පූජාර්ථය පෙරදැරි කොට ගත් වාදන භාණ්ඩ හා විවිධ තාලානුරූපව වලිනඬ වාදනය කළයුතු අතර,
  හේවිසි වාදනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ මේ සඳහා ඇතුළත් විය යුතුය.
- ❖ මේ සඳහා සහභාගි විය හැකි ශිල්පීන් සංඛ්‍යාව අවමය 08 කි. උපරිමය 12 කි.
  කාලය අවමය විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.

**<u>බලි ශාන්ති කර්ම සහ හේවිසි වාදන තරග ඉසව් හැර සෙසු තරඟ ඉසව් සියල්ල සඳහා පහත දැක්වෙන තරග කොන්දේසි බලපානු ඇත.</u>**

- ❖ අවම කාලය විනාඩි 05 කි. උපරිමය විනාඩි 07 කි.
- ❖ සමූහ නර්තන සඳහා සහභාගි විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 12 කි.
- ❖ සියළුම තරග සඳහා ඉදිරිපත් වන වාද්‍ය ශිල්පීන් සාම්ප්‍රදායික ඇඳුමින් සැරසී සිටීම අනිවාර්ය වේ.
- ❖ "ඒ" කොටස සඳහා ඉදිරිපත් කොට ඇති තරග ඉසව් 07 සඳහාම වෙන වෙනම ප්‍රථම/දෙවන/තෙවන වශයෙන් මුදල් ත්‍යාග පිරිනමන අතර, ත්‍යාග පහත පරිදි වේ.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ **කුසලතා සහතික 02**

## 4.2 "බී" කොටසේ කලායතන තරග

### I. උඩරට ශාස්ත්‍රීය නැටුම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | පලවැල දානය |
| පිරිමි | - | දුනුමාලප්පුව |
| මිශ්‍ර | - | කොල්පාඩුව |

### II. සාම්ප්‍රදායික වන්නම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | උරගා වන්නම |
| පිරිමි | - | ගජගා වන්නම |
| මිශ්‍ර | - | මුසලාඩි වන්නම |

### III. පහතරට ශාස්ත්‍රීය නැටුම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | ශුද්ධ මාත්‍රා |
| පිරිමි | - | විශ්ණු මල් අස්න |
| මිශ්‍ර | - | පත්තිනි මල් අස්න |

### IV. සබරගමු ශාස්ත්‍රීය නැටුම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | කදම්භ පක්ෂි වන්නම |
| පිරිමි | - | මල් පදය |
| මිශ්‍ර | - | සමන් දෙවි මල් යහන් කවි |

### V. ගැමි නැටුම් (සමූහ)

| | | |
|---|---|---|
| ගැහැණු | - | පන් නෙලීම |
| පිරිමි | - | කඩු |
| මිශ්‍ර | - | තාලම් |

## VI. බලි ශාන්ති කර්ම - සමූහ

- විවිධ තාල හා නාද මාලා සහිත බලි කවි, සන්න කවි, ග්‍රහ පංති කවි,මඩු සැරසිලි කවි ආදිය අවශ්‍ය පරිදි භාවිතා කළ හැකිය.
- අභිමත පරිදි එක් සම්ප්‍රදායක් යොදා ගත හැකිය.
- ගැහැණු, පිරිමි, මිශ්‍ර වශයෙන් ඉදිරිපත් විය හැකිය.
- සහභාගි වන ශිල්පීන් සංඛ්‍යාව 06 ට නොඅඩු 10 ට නොවැඩි විය යුතුය. වාදන ශිල්පීන් මෙම සංඛ්‍යාවට ඇතුළත් නොවේ.
- අවම කාලය විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.
- අවශ්‍ය වන්නේ නම් බලි රූප, බලි මැස්ස ආදිය රංග භාණ්ඩ ලෙස භාවිතා කළ හැකිය.

## VII. හේවිසි වාදනය - සමූහ

- ගැහැණු, පිරිමි, මිශ්‍ර වශයෙන් ඉදිරිපත් විය හැකිය.
- පූජාර්ථය පෙරදැරි කොට ගත් වාදන භාණ්ඩ හා විවිධ තාලානුරූපව වාදනය කළයුතු අතර, හේවිසි වාදනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ මේ සඳහා ඇතුළත් විය යුතුය.
- මේ සඳහා සහභාගි විය හැකි ශිල්පීන් සංඛ්‍යාව අවමය 08 කි. උපරිමය 12 කි.
  කාලය අවමය විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.

**බලි ශාන්ති කර්ම සහ හේවිසි වාදන තරග ඉසව් හැර සෙසු තරග ඉසව් සියල්ල සඳහා පහත දැක්වෙන තරග කොන්දේසි බලපානු ඇත.**

- අවම කාලය විනාඩි 05 කි. උපරිමය විනාඩි 07 කි.
- සමූහ නර්තන සඳහා සහභාගි විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 12 කි.
- සියළුම තරග සඳහා ඉදිරිපත් වන වාද්‍ය ශිල්පීන් සාම්ප්‍රදායික ඇඳුමින් සැරසී සිටීම අනිවාර්ය වේ.
- "ඒ" කොටස සඳහා ඉදිරිපත් කොට ඇති තරග ඉසව් 07 සඳහාම වෙන වෙනම ප්‍රථම/දෙවන/තෙවන වශයෙන් මුදල් ත්‍යාග පිරිනමන අතර, ත්‍යාග පහත පරිදි වේ.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය
- **කුසලතා සම්මාන 02 කි.**

## 4.3 හොඳම නර්තන කලායතනය තේරීම

- ❖ ඉහත ඉසව් සඳහා ලබා ගන්නා ලකුණු මත පහත සඳහන් ආකාරයට හොඳම "ඒ" කොටසේ හා "බී" කොටසේ කලායතන තෝරනු ලබයි.
- ❖ ප්‍රථම ස්ථානය සඳහා ලකුණු 15 ක්ද දෙවන ස්ථානය සඳහා ලකුණු 10 ක්ද තෙවන ස්ථානය සඳහා ලකුණු 05 ක්ද යන පදනම මත ඇගයීම් කර වැඩිම ලකුණු ලබා ගන්නා ලද කලායතන සඳහා පහත සඳහන් අයුරින් ත්‍යාග සහ සහතික පත් පිරි නමනු ලැබේ.

| ත්‍යාග. | "ඒ" | "බී" |
|---|---|---|

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය
- ❖ **ප්‍රථම, දෙවන,තෙවන, ස්ථාන සඳහා ජය සංකේත පිරිනැමේ.**

## 4.4.I කලායතන ගුරුවරුන් සඳහා පැවැත්වෙන තරග

- මේ සඳහා පළාතේ කලායතනවල ගුරුභවතුන්ට පමණක් සහභාගී විය හැකිය.
- මේ සඳහා ගැහැනු හෝ පිරිමි ශිල්පීන්ට සහභාගි විය හැකිය.
- වාදන ශිල්පීන් සාම්ප්‍රදායික ඇඳුමින් සැරසී සිටීම අනිවාර්ය වේ.
- කාලය අවමය විනාඩි 05 කි. උපරිමය විනාඩි 07 කි.
- 

**උඩරට ශාස්ත්‍රීය නැටුම්**

ගැහැණු - පලවැල දානය

පිරිමි - අඟුරු දුම්මල පාලි

**පහතරට ශාස්ත්‍රීය නැටුම්**

ගැහැණු - ශුද්ධ මාත්‍රා

පිරිමි - තෙල්මෙ

**සබරගමු ශාස්ත්‍රීය නැටුම්**

ගැහැණු - කෙන්ඩි පාලිය

පිරිමි - ගුරුගේ මාලාව

- ❖ ගුරුවරුන්ගේ තරග ඉසව් සඳහා වෙන වෙනම ත්‍යාග මුදල් පිරිනැමේ.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 4.4. II බෙර වාදනය (විවෘත) - යුගල

- ❖ **උඩරට බෙර වාදනය**

  අත්‍යා බෙර - විවිධ තිත් මාත්‍රා අලංකාර පද සමඟ වාදනය කළ යුතුය.

- ❖ **පහතරට බෙර වාදනය**

  සතර වට්ටම් වාදනය (යුගල වශයෙන් )

- ❖ **සබරගමු දවුල් වාදනය**

  අත්‍යා දවුල් වාදනය (යුගල වශයෙන් )

- මේ සඳහා පළාතේ පදිංචි ඕනෑම ශිල්පියෙකුට සහභාගී විය හැකිය.
- මේ සඳහා ගැහැනු හෝ පිරිමි ශිල්පීන්ට සහභාගි විය හැකිය.
- වාදන ශිල්පීන් සාම්ප්‍රදායික ඇඳුමින් සැරසී සිටීම අනිවාර්ය වේ.
- කාලය අවමය විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 4.4.II බෙර වාදන - ඒකල (විවෘත)

- ❖ **උඩරට බෙර වාදනය**

  අත්‍යා බෙර - විවිධ තිත් මාත්‍රා

  ( අලංකාර පද වාදනය කළ යුතුය)

- ❖ **පහතරට බෙර වාදනය**

  සව්දම්, වන්දමානම් වාදනය

- ❖ **සබරගමු දවුල් වාදනය**

  සව්දම්, වන්දමානම් වාදනය

- ❖ මේ සඳහා පළාතේ පදිංචි ඕනෑම ශිල්පියෙකුට සහභාගී විය හැකිය.
- ❖ මේ සඳහා ගැහැනු හෝ පිරිමි ශිල්පීන්ට සහභාගි විය හැකිය.
- ❖ වාදන ශිල්පීන් සාම්ප්‍රදායික ඇඳුමින් සැරසී සිටීම අනිවාර්ය වේ.
- ❖ කාලය අවමය විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 4.5 නව නිර්මාණ නැටුම් - සමූහ (විවෘත)

- ❖ උතුරු මැද පළාතට අයත් කලායතන ශිල්පීන්ට පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පෞද්ගලික සංවිධාන වලට හා කණ්ඩායම් වලට මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැකිය.
- ❖ එක් කලායතනයකින් පාසලකින් හෝ කණ්ඩායමකින් ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- ❖ කිසිදු ආගමකට ජාතියකට ජන කණ්ඩායමකට පටහැණි හෝ අගෞරව නොවන නිර්මාණයක් විය යුතුය.
- ❖ පද මාලාව හා නාද මාලාව නව නිර්මාණාත්මක විය යුතුය. (භාවිතා කරන්නේ නම්)
- ❖ ස්වාධීන ශෛලියකට අනුව නිර්මාණය කළ හැකි අතර, අදහස ප්‍රකාශ වන පරිදි චලන, ඇඳුම් නිර්මාණය විය යුතුය.
- ❖ සහභාගි වන ශිල්පීන් සංඛ්‍යාව 06 ට නොඅඩු විය යුතු  අතර, 20 ට නොවැඩි විය යුතුය. වාදන ශිල්පීන් මෙම සංඛ්‍යාවට ඇතුළත් නොවේ.

- ❖ අවම කාලය විනාඩි 05 කි. උපරිම කාලය විනාඩි 07 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන  ස්ථානය
- ❖ තෙවන  ස්ථානය

## 4.6 ඉන්දියානු නර්තන සම්ප්‍රදාය -  සමූහ (විවෘත)

- ❖ ඉන්දියානු  සහ වෙනත් සම්ප්‍රදායට අයත් භරත/කතක්/කථකලි/ මණිපූරි/ කුච්චිපුඩි (ඔඩිසි) යන එක් නර්තන සම්ප්‍රදායකින් සමූහ නර්තන අංගයක් හෝ සල්සා , හිපොප් (Hepop) ජයිව් වැනි නර්තන සම්ප්‍රදායක් විය යුතුය.
- ❖ සංගීතය වාදනය සඳහා සංයුක්ත තැටි/කැසට් පට හෝ අදාළ නර්තන සම්ප්‍රදායට අයත් ශාස්ත්‍රීය සංගීත භාණ්ඩ හෝ වාදන කණ්ඩායමක්, හෝ නිර්මාණාත්මක ශෛලියේ භාණ්ඩ භාවිතා කළ හැකිය.
- ❖ දමිළ, හින්දි චිත්‍රපටි හෝ වෙනත් භාෂාවන්ට අයත් ගී හෝ ගීත නර්තන මේ සඳහා යොදා ගත හැකිය.
- ❖ නර්තනයට අදාල ඇඳුමින් සැරසී සිටිය යුතු අතර, කාලය අවමය විනාඩි 05 කි. උපරිමය විනාඩි 07 කි.
- ❖ සහභාගි විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 12 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන  ස්ථානය
- ❖ තෙවන  ස්ථානය

## 4.7 කෙටි මුද්‍රා නාට්‍ය - (විවෘත)

- මේ සඳහා ගැහැනු, පිරිමි, මිශ්‍ර වශයෙන් ඉදිරිපත් විය හැකිය.
- ඕනෑම තේමාවක් යටතේ නිර්මාණය සකසා ගත හැකි අතර, දේශීය සංස්කෘතියට, කිසියම් ආගමකට, ජන කොට්ඨාසයකට, කිසියම් දේශපාලන පක්ෂයකට හෝ රජයට අපහාසයක් නොවන නිර්මාණයක් විය යුතුය.
- සංගීතය සඳහා පටිගත කර ගත් සංගීත ඛණ්ඩ හෝ සජීව සංගීතය භාවිතා කළ හැකිය. පටිගත කර ගත් සංගීත භාවිතා කරන්නේ නම් ඒවායේ නිර්මාණ අයිතිය හෙවත් "කොපි රයිට්" පිළිබඳ වගකීම එය භාවිතා කරන කණ්ඩායම භාර ගත යුතුය.
- කාලය අවමය විනාඩි 15 කි. උපරිමය විනාඩි 25 කි.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

## 4.8 ගීත අනුව නර්තන - ළමා (විවෘත)

- වයස අවුරුදු 13සහ 13 ට අඩු තරගකරුවන්ට මේ සඳහා ඉදිරිපත් විය හැකිය.
- සහභාගී විය හැකි ශිල්පීන් සංඛ්‍යාව 10 – 16 ත් අතර වේ.
- ඔබ කැමති ළමා ගීතයක් මේ සඳහා යොදා ගත හැකි අතර නර්තන වින්‍යාසය හා ඇඳුම් පැළඳුම් ළමා මනසට ගෝචර වන අන්දමින් සකසා තිබිය යුතුය.

**ත්‍යාග.**

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තෙවන ස්ථානය

## 4.9 ජන නැටුම් (විවෘත)

කලායතන වල ඉගෙනුම ලැබූ හා ග්‍රාම සංවර්ධන සමිති ,කාන්තා සමිති, වැඩිහිටි සමිති හා වෙනත් සංවිධාන වල සිටින අවුරුදු 35 ට වැඩි කාන්තා හා පිරිමි අයදුම් කරුවන්ට ඉදිරිපත් විය හැක.

- මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැකි සංඛ්‍යාව 10 වන අතර උපරිම සංඛ්‍යාව 20 විය යුතුය.(වාදන හා ගායන සංඛාව මීට අදාළ නොවේ.)
- පන්,ගොයම්,කළගෙඩි,කඩු,සවරන්,පතුරු,කුළු,කුරක්කන්,රබන් ආදී ඕනෑම නර්තන අංගයක් ඉදිරිපත් කළ හැකිය.
- අවම කාළය විනාඩි 05 වන අතර උපරිමය විනාඩි 07 කි.

**ත්‍යාග.**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

## 05 දමිළ හා මුස්ලිම් ජන නැටුම් තරගය

උතුරු මැද පළාත තුළ සිටින දමිළ හා මුස්ලිම් ජාතීන් සඳහා මෙම තරගය අදාළ වේ.මේ සඳහා දමිළ හා මුස්ලිම් ජාතීන්ට ආවේනික වූ ජන නැටුම් හා වාද්‍ය භාණ්ඩ භාවිතා කළ යුතුය.

- ❖ අවම කාළය විනාඩි 05 වන අතර උපරිමය විනාඩි 07 කි.
- ❖ මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැකි සංඛ්‍යාව 10 වන අතර උපරිම සංඛ්‍යාව 20 විය යුතුය.(වාදන හා ගායන සංඛ්‍යාව මීට අදාළ නොවේ.)

**ත්‍යාග.**

## 5.1 <u>නිවේදන තරගය</u>

- ❖ උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි වයස අවුරුදු 18-35 අතර නිවේදන කටයුතු සඳහා දක්ෂ තරුණ තරුණියන් සඳහා මෙම තරගය පැවැත්වේ. තරගයට ඉදිරිපත් වන තරගකරුවන් පහත සඳහන් කරුණු වලින් යුක්ත විය යුතුය.
- ❖ මයික්‍රෝෆෝනයට උචිත හා ගැළපෙන කට හඬක් තිබිය යුතුය.
- ❖ ඉදිරිපත් කිරීමේදී කුසලතාව හා අවබෝධය තිබිය යුතුය.
- ❖ දැනට නිවේදන කටයුතුවල නියැලෙන අයට (පිළිගත් ආයතනයක) මෙම තරගය සඳහා ඉදිරිපත් විය නොහැක.
- ❖ පසුගිය වර්ෂ වලදී පැවැති උතුරු මැද කලා උළෙලයන්හි දී සහ පිළිගත් දිස්ත්‍රික් තරඟ වලින් ජයග්‍රහණය ලැබූ (ප්‍රථම/දෙවන/තෙවන) තරගකරුවන්ට මේ සඳහා ඉදිරිපත් විය නොහැකිය.
- ❖ ප්‍රථම/දෙවන/තෙවන වශයෙන් තෝරා ගන්නා ලද ජයග්‍රාහකයින් උතුරු මැද කලා උළෙලේ නිවේදන කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**ත්‍යාග**

- ❖ ප්‍රථම ස්ථානය
- ❖ දෙවන ස්ථානය
- ❖ තෙවන ස්ථානය

මෙම තරග මාලාව හා සරසවි සංහිඳ ප්‍රාදේශීය කලා උළෙල සාර්ථක කර ගැනීම සඳහා ඔබ සැමගේ සහයෝගය හා උපරිම දායකත්වය ඉතසිතින් බලාපොරොත්තු වෙමි.

...................................
සභාපති/ලේකම්

# <u>සරසවි සංහිද ප්‍රාදේශීය කලා උළෙල - 2020 අයදුම් පත්‍රය</u>

01. තරඟකරුගේ නම:- ..........................................................................................................

..........................................................................................................................

02. පෞද්ගලික ලිපිනය:- ..................................................................................................

..........................................................................................................................

03. දුරකථන අංකය:- .........................................................................................................

04. විදුහලේ/පිරිවනේ/කලායතනයේ/දහම් පාසලේ/ස්වේච්ඡා සංගමයේ/ සේවා ස්ථානයේ නම හා ලිපිනය:-

..................................................................................................................

..........................................................................................................................

05. කලායතනයක් ඇත්නම් නම හා ලියාපදිංචි අංකය:- ..........................................................

06. ඉදිරිපත් වන තරඟ ඉසව්ව:- ...........................................................................................

07. උපන් දිනය හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-.............................................

08. ස්ත්‍රී/පුරුෂ භාවය :- ....................................................................................................

09. ඉගෙනුම ලබන ශ්‍රේණිය :- .............................................................................................

10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ....................................................................................

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- ........................................................................................

මෙම අයදුම්පතෙහි සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු බවත්, ප්‍රකාශ කරමි.

දිනය - .......................................  ...........................................................

අයදුම්කරුගේ අත්සන

මෙයට යා කොට ඇති ................................................................................................ ඉහත නම් සඳහන් අයගේම නිර්මාණයක් බවත්, මෙහි සඳහන් කරුණු නිවැරදි බවත් සහතික කරමි.

දිනය - ................................  ........................................................

ආයතන ප්‍රධානී/ විදුහල්පති/කලායතනාධිපති/

දහම් පාසල් ප්‍රධානාචාර්ය/ග්‍රාම නිලධාරි

(අත්සන හා නිල මුද්‍රාව)

සැ.යු. ඔබ හෝ ඔබ ආයතනය ඉදිරිපත් වන තරඟ ඉසව්වට අදාල සියලුම කරුණු සම්පූර්ණ කළ යුතු අතර අදාල නොවන කරුණු ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.